# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2343/57 - 2023 අගෝස්තු මස 04 වැනි සිකුරාදා - 2023.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**කුලියාපිටිය නගර සභා බල ප්‍රදේශය සහ කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2023 මැයි මස 11 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, කුලියාපිටිය නගර සභා බල ප්‍රදේශය සහ කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 ජූලි මස 21 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කුලියාපිටිය නගර සභා බල ප්‍රදේශය සහ කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිලිබඳ දැන්වීමයි**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, කුලියාපිටිය නගර සභා බල ප්‍රදේශය සහ කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම 2023 ක් වූ ජුලි මස 21 වන දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 ජූලි මස 28 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

**කුලියාපිටිය නගර සභා බල ප්‍රදේශය සහ කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව කුලියාපිටිය නගර සභා බල ප්‍රදේශය සහ කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 ජූලි මස 21 වන දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

**නිමේෂ් හේරත්,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2023 ජූලි මස 28 වැනි දින,

EOG 08-0056

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.